කොවිඩ්-19 වැළඳී මරණයට පත්වූ වෛද්‍යවරයා සම්බන්ධයෙන් සෑම මාධ්‍යයකම පාහේ පුවත් වාර්තාවන් හා ආවරණයන් දක්නට ලැබිණි. සිංහල භාෂා පුවත්පත් සම්බන්ධයෙන් සලකා බලන විට මව්බිම, දිවයින, අරුණ, ලංකාදීප, අද සහ දිනමිණ පුවත්පත් මෙම පුවත වාර්තා කොට තිබිණි.

කෙසේ නමුත් මව්බිම, දිවයින, අරුණ, ලංකාදීප සහ අද යන පුවත්පත් සියල්ලේම මියගිය අයගේ මෘතදේහය ආදාහනාගාරය වෙත ගෙන යන ආකාරයේ ඡායාරූපයක්ද ඉදිරිපත් කර තිබිණි. එවැනි ඡායාරූපයකින් තොරව මරණය සම්බන්ධයෙන් වාර්තා කර තිබුණේ දිනමිණ පමණි.

කොවිඩ්-19 වාර්තාකරණය සම්බන්ධයෙන් රජය නිකුත් කරන්නට යෙදුණු නිර්දේශයන් තුළ, රෝගියෙකු මියගිය අවස්ථාවේදී අදාළ දේහය ආදාහනාගාරයට රැගෙන යන අයුරු පෙන්වීම ඔස්සේ මියගිය පුද්ගලයාට යම් අගෞරවයක් සිදුවන බැවින් එම දර්ශන ඉදිරිපත් කිරීමෙන් වළකින ලෙසට කර ඇති ඉල්ලීමක් තිබේ. මෙය පුවත්පත් තුළ පළවන ඡායාරූප සඳහාද අදාළ කරගත හැක.

ඒ අනුව, මියගිය අයගේ මෘතදේහය ආදාහනාගාරය වෙත ගෙන යන අයුරු පළ කිරීම මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් නොවන්නේද?

මූලාශ්‍ර:

https://mcusercontent.com/e5e1192127653987d107e6f98/images/76820bda-4513-4f3d-9d49-0f0637e78d5d.jpg?fbclid=IwAR0N76n6bdrvt1jegwr8t_glc5WpDfWG3og5jjYmnhdWY6pkobDb9fW9k8A

#MediaEthicsSL #lka #SinhalaPress #Mawbima #Divaina #Aruna #Lankadeepa #Ada #Dinamina